(21)

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

**විගණන විමසුම - AUDIT QUERY - கணக்காய்வு விசாரணை**

| | | | |
|---|---|---|---|
| විමසීම් අංකය / விசாரணை இலக்கம் / Query No | SGLG/KG/AA/PS/2024/AQ/16(12) | නිකුත් කරන දිනය / வழங்கிய திகதி / Date of issue | 2025 මාර්තු 14 දින |

Addressed to: ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී, ප්‍රාදේශීය සභාව, වරකාපොළ.

විෂයය / விடயம் / Subject: සංවර්ධන ව්‍යාපෘති පරීක්ෂාව - 2024 වර්ෂය

**මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.**
This is only a query calling for information for clarification and not an audit report.
**இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.**

---

ඔබ විසින් නිරතුරුවම විගණනය වෙනුවෙන් දක්වනු ලබන දායකත්වය අගය කරන අතර, වරකාපොළ ප්‍රාදේශීය සභාවේ 2024 වර්ෂයට අදාල සංවර්ධන ව්‍යාපෘති පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පහත සඳහන් කරුණු සනාථ කර ගැනීම සඳහා ඔබගේ කාරුණික දායකත්වය අපේක්ෂා කරමි.

02. සංවර්ධන ව්‍යාපෘති පරීක්ෂාව

---------------------------------

(අ) ප්‍රාදේශීය සභා අරමුදල් ව්‍යාපෘති

-----------------------------------

ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය අදාළව උපලේඛන 01 හි සඳහන් පරිදි රු.147,770,000 ක්වූ ව්‍යාපෘති (කර්මාන්ත) 23 ක් සභා අරමුදලින් ඉටුකිරීම සඳහා ඉලක්ක කර තිබුණද වර්ෂය අවසන් වන තුරුත් එකී ව්‍යාපෘති ඉටුකර නොතිබුණි.

(ආ) සභා අරමුදල් නොවන අනිකුත් ව්‍යාපෘති

---------------------------------------------

ප්‍රාදේශීය සභාව විසින් වෙනත් ආයතන වලින් අරමුදල් සපයන ව්‍යාපෘති 339 ක් ඉටුකිරීම සඳහා ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැඩසටහන | වැඩ යෝජනා සංඛ්‍යාව | වැඩ අවසන් (ක්‍රියාත්මක කරන ලද) ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|
| කඳුකර දශකය | 100 | 94 | 06 |
| ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන | 04 | 02 | 02 |
| සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | 02 | 02 | - |
| ප්‍රධාන අමාත්‍යාංශය | 68 | 59 | 09 |
| දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 21 | 20 | 01 |
| ග්‍රාමීය මාර්ග කර්මාන්ත | 71 | 65 | 06 |
| විමධ්‍යගත කර්මාන්ත | 73 | 70 | 03 |
| එකතුව | 339 | 312 | 27 |

මේ අනුව සමස්ත යෝජනා 339 න් 25 ක්ම 2024 දෙසැම්බර් 31 වන විට වැඩ අවසන් කර නොතිබුණු අතර ප්‍රධාන අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලද කර්මාන්ත 02 ක ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඇ) ඉටුකරන ලද කර්මාන්ත 10 කට අදාල ලිපිගොනු නියදියක් පරීක්ෂා කරන ලද අතර, එහිදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

i. ව්‍යාපෘති ඇස්තමේන්තු කිරීමේදී නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඇස්තමේන්තු සැකසිය යුතු වුවද, එසේ කටයුතු කළ බවට ලිපිගොනුවෙහි සාක්ෂි නොතිබුණු අතර මාර්ග සංවර්ධන ව්‍යාපෘති වල අවශ්‍ය ස්ථාන අතහැර එක් එක් පුද්ගල අවශ්‍යතා මත ව්‍යාපෘති තෝරාගැනීම හා ඇස්තමේන්තු කිරීම සිදුකර තිබුණි. මේ අනුව ව්‍යාපෘති තෝරා ගැනීමේදී එක් එක් මන්ත්‍රීවරයාට වෙන් කරන ලද ප්‍රතිපාදන පදනම් කරගෙන ව්‍යාපෘති තීරණය කිරීම නිසා මාර්ගයේ හෝ ගොඩනැගිලි වල අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි.

උදාහරණ වශයෙන් අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

1. දැදිගම මලන්දෙණිය අඹලෙන පිවිසුම් මාර්ගයට හා පඩිපෙළ සංවර්ධනය කිරීම.
2. බුරුන්නාව අඹගහමුල පාර පැති බැම්ම ඉදි කිරීම.
3. බුරුන්නාව කුරුපට්ටිය මාවත සංවර්ධනය කිරීම.

ii පරික්ෂා කරන ලද ලිපිගොනු අනුව කර්මාන්තයට අවශ්‍ය ද්‍රව්‍ය අදාල වැඩ බිමට ලැබුණු බවත් එකී ද්‍රව්‍ය මිණුම් ගැනීමට හැකිවන පරිදි ගොනුකර,පරීක්ෂා කර, සහතික කල බවට තොරතුරු අනාවරණය නොවුණි.

iii ව්‍යාපෘති (කර්මාන්ත) ඇස්තමේන්තු සැකසීමේදී ඒ සඳහා භාවිතාකරන ගාස්තු උප ලේඛනයේ යොමුව දැක්විය යුතු වුවද, ප්‍රදේශීය සභාව විසින් සකස් කරන ලද ඇස්තමේන්තු හා ගෙවීම් සඳහා උපයෝගී කර ගන්නා මිණුම් සටහන් වල එකී ගාස්තු උපලේඛන යොමුව දක්වා නොතිබුණු අතර අදාල ඉදිකිරීම් ගාස්තු වලට අමතරව ප්‍රවාහන වියදම් සඳහාද සැලකිය යුතු වටිනාකමක් ඇතුලත් කර ඇති බවද නිරීක්ෂණය විය. ප්‍රවාහන වියදම් ඇතුළත් කල අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| ව්‍යාපෘතිය | මුළු වැඩ වටිනාකම | ප්‍රවාහන වියදම | මුළු වියදමෙන් ප්‍රතිශතය |
|---|---|---|---|
| ------------ | ----------------- | ------------- | ---------------------------- |
| | රු. | රු. | % |
| 1. දැදිගම මලන්දෙණිය අඹලෙන පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම. | 1,710,657 | 32,771 | 1.91 |
| 2. බුරුන්නාව කුරුපට්ටිය මාර්ගය සංවර්ධනය කිරීම. | 489,655 | 6,155 | 1.25 |
| 4. බුරුන්නාව කුරුපට්ටිය මාවතේ දුෂ්කර ස්ථාන සංවර්ධනය කිරීම. | 286,283 | 9,886 | 3.45 |
| 5. ඉහළ ලෙනගල කොබ්බෑවල හරහා මාර්ගය සංවර්ධනය කිරීම. | 970,924 | 34,118 | 3.51 |



CS CamScanner

| | | | |
|---|---|---|---|
| 6. බුරුන්නාව ගම්මැද මාර්ගය සංවර්ධනය | 388,000 | 12,924 | 3.33 |
| 7. උඩුකුඹුර හම්බග්ගල මාර්ගයේ ආරම්භන ස්ථානයේ රැඳවුම් බැම්ම ඉදිකිරීම. | 456,386 | 7,634 | 1.67 |
| 8. බුරුන්නාව අඹගහමුල පාර පැති බැම්ම ඉදිකිරීම. | 415,392 | 7,925 | 1.91 |

iv. එකම ගොඩනැගිල්ල හෝ එකම මාර්ගය සංවර්ධනය සඳහා ආයතන කිහිපයක් හෝ එකම ආයතනයෙන් ප්‍රතිපාදන ලබාගෙන ව්‍යාපෘති කිහිපයක් ලෙස ඉටුකර ගැනීම නිසා වෙනත් අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති (අනෙකුත් ප්‍රදේශ වලට) ඉටුකර ගැනීමට ඇති අවස්ථා අහිමිවීමේ හැකියාවක් ඇති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| අනු අංකය | ව්‍යාපෘතිය | අනුමතාත අංකය (ගොනු අංකය) | ප්‍රතිපාදන ලබාදෙන ආයතනය/ වැඩසටහන | ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|
| -------- | ------------ | ----------------- | ------------- | ---------------- |
| | | | | රු. |
| 20 | වද්දෙණිය සංගිලි පාලම අළුත්වැඩියා කිරීම | LGR-2413903 | ප්‍රධාන අමාත්‍යාංශය | 1,000,000 |
| 07 | වද්දෙණිය සංගිලි පාලම අළුත්වැඩියා කිරීම | ව.ප්‍රා.ස.සං.31 දි.වි.සං.07 | දිස්ත්‍රික් විශේෂ සංවර්ධන වැඩසටහන | 485,000 |
| 45 | හසන්පුර අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | LGR(53)-2413908 | ප්‍රධාන අමාත්‍යාංශය | 500,000 |



CamScanner

| | | | | |
|---|---|---|---|---|
| 37 | හසන්පුර අතුරු රුදවුම් බැම්ම සංවර්ධනය කිරීම | LGR-2413904 | ප්‍රධාන අමාත්‍යාංශය | 1,000,000 |
| 60 | ගණිතපුර හසන්පුර මාර්ගය සංවර්ධනය කිරීම | LGR(53)-2413902 | ප්‍රධාන අමාත්‍යාංශය | 400,000 |
| 57 | ඉහළවෙල පළමු පටුමග සංවර්ධනය කිරීම | LGR(53)-2413904 | ප්‍රධාන අමාත්‍යාංශය | 500,000 |
| 63 | ඉහළවෙල පළමු පටුමග සංවර්ධනය කිරීම | LGR(53)-2413925 | ප්‍රධාන අමාත්‍යාංශය | 500,000 |
| 01 | ඉහළ ලෙනගල ඓතිහාසික ලෙනකඩුව විහාරස්ථානයේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම | ව.ප්‍රා.ස.සං.31 සං.වැ.01/2024 | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | 1,475,629 |
| 27 | ඉහළ ලෙනගල ලෙනකඩුව, රජමහා විහාරස්ථානය අසලින් දිවෙන මාර්ගයේ ආරක්ෂිත පැති බැම්ම ඉදිකිරීම | ව.ප්‍රා.ස.සං.31 කඳු.දශ. 27/2024 | කඳුකර දශකය වැඩසටහන | 970,714 |
| 05 | කැටගොඩෙවත්ත කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම | SWS/2413901 | ප්‍රධාන අමාත්‍යාංශය | 2,600,000 |
| | ඝණ අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානය දෙවන අදියර ස්ථාපිත කර ගැනීම. | NSW/SG/SWM/2024/NP/04 ව.ප්‍රා.ස. | | 3,091,213 |



CamScanner

03. සංවර්ධන ව්‍යාපෘති (කර්මාන්ත) භෞතික පරීක්ෂාව

---

ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති (කර්මාන්ත) වලින් නියැදියක් ලෙස තෝරාගත් ව්‍යාපෘති 09 ක් 2025 ජනවාරි 23 හා 24 දිනවල භෞතිකව පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

3.1 ඉහල ලෙනගල ඓතිහාසික ලෙනකඩුව විහාරස්ථානයේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම

---

මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා වැඩ විෂයයන් 15 ක් ඇතුළත් කර රු.1,475,629.72 ඇස්තමේන්තුවක් සකස්කර මිල ගණන් කැඳවීමකින් තොරව (රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021 දරන 2021.09.29 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව) පනාන ග්‍රාම සංවර්ධන සමිතියට මාස 02 ක් ඇතුළත කර්මාන්තය ඉටු කිරීම සඳහා 2024 ඔක්තෝබර් මස 24 දින ගිවිසුම් ගතව එකී සමිතියට 2024 දෙසැම්බර් 24 දිනැතිව රු.1,175,679.24 ක මුදලක් ගෙවීම සඳහා කටයුතු සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඇස්තමේන්තු සැකසීම නිසා ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩ අවසන් වාර්තාවේ ප්‍රමාණ අඩු බැවින් අධි ඇස්තමේන්තු පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

| වැඩ විෂයය අංකය | වැඩ විස්තරය | ඇස්තමේන්තුගත ප්‍රමාණය | සත්‍ය ප්‍රමාණය | වෙනස | වෙනසෙහි වටිනාකම |
|---|---|---|---|---|---|
| | | වර්ග මීටර් / ඝණ මීටර් | වර්ග මීටර් / ඝණ මීටර් | වර්ග මීටර් / ඝණ මීටර් | රු. |
| 03 | මි.මී.25 ඝණකම සහිතව කොන්ක්‍රීට් යෙදීම සඳහා සැටලිං ගැසීම | 32.40 | 14.22 | 18.18 | 40,195 |


| | | | | | |
|---|---|---|---|---|---|
| 04 | 1:3:6 මිශ්‍රණය 20% කොන්ක්‍රීට් යෙදීම | 07.02 | 04.67 | 2.35 | 50,887 |
| 07 | පස් යෙදීම | 07.20 | 0.40 | 6.8 | 10,200 |
| 08 | කොන්ක්‍රීට් මට්ටම් කිරීම හා සුමට කිරීම | 212.50 | 170.02 | 42.48 | 5,832 |
| 09 | පොලිතින් ඇතිරීම | 212.50 | 169.57 | 42.93 | 3,636 |
| 11 | මි.මී. 25 කොන්ක්‍රීට් යෙදීම | 31.88 | 26.26 | 5.62 | 173,001 |


(ආ) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සැකසීමේදී මාර්ග අවශ්‍යතාවය හඳුනාගෙන අදාළ ස්ථානවල බෝක්කු, පැති බැමි, ආරක්ෂිත ගල් හෝ ආරක්ෂිත වැටවල්, කානු පද්ධති හා උරහිස් පිළිබඳ සැලකිලිමත් නොවීම නිසා මෙම මාර්ගය භාවිතා කරන්නන්ට මෙන්ම මාර්ගයටද අනාරක්ෂිත තත්ත්වයක් ඇති බවද නිරීක්ෂණය විය. විස්තර ඡායාරූප 01 හි දැක්වේ.





(ඇ) වැඩ විෂය අංක 11 ට අනුව 1:3:4 (මි.මී.19) කොන්ක්‍රීට් යෙදීම මි.මී. 150 උස කොන්ක්‍රීට් යොදා ඇතිබව දක්වා තිබුණද භෞතික පරීක්ෂාවේදී හියුම්බට යොදා ඇති ස්ථානවල උස මි.මී.25-35 ක් පමණ වන බවත් නිරීක්ෂණය වූයෙන් මාර්ගයේ හියුම් තාප්පය හා කොන්ක්‍රීට් ඉතා ඉක්මනින් කැඩීයාමේ අවදානමක් පවතින බවත් කොන්ක්‍රීට් තට්ටුව අවශ්‍ය ඝණකමට යොදා නොමැති බවත් නිරීක්ෂණය විය. විස්තර ඡායාරූප 02 හි දැක්වේ.





3.2 බුරුන්නාව අඹගහමුල පාර පැති බැම්ම ඉදිකිරීම

-----------------------------------------------------

මෙම ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා වැඩ විෂයන් 10 ක් ඇතුළත් කර ඇස්තමේන්තුවක් සකස් කර මිල ගණන් කැඳවීමකින් තොරව 2021.09.29 දිනැති අංක 01/2021 දරන මුදල් චක්‍රලේඛය ප්‍රකාරව බුරුන්නාව ග්‍රාම සංවර්ධන සමිතියට මාස 02 ක් ඇතුළත කර්මාන්ත ඉටුකිරීම සඳහා 2024 ජූලි 15 දින ගිවිසුම් ගතව, එකී සමිතියට 2024.09.05 දිනැතිව රු.415,392 මුදලක් ගෙවීම් කිරීමට අවශ්‍ය කටයුතු සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් විය.

(ඇ) පැති බැම්ම මෙම මාර්ගයේ කෙළවර ඉදිකර තිබුණු අතර, මාර්ගයේ මුල් කොටස මාර්ග සංවර්ධන අවශ්‍යතා රැසක් පැවති අතර ඇතැම් ස්ථානවල වාහන ධාවනය කිරීමට ද අසීරු තත්ත්වයක පැවතුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සැකසීම නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකොට කටයුතු කිරීම නිසා ඇස්තමේන්තුගත ප්‍රමාණය හා ඉටුකළ ප්‍රමාණය අතර සැලකිය යුතු තරම් වෙනස්කම් (විචලනයන්) නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වැඩ විෂයය අංකය | වැඩ විස්තරය | ඇස්තමේන්තු ප්‍රමාණය | සත්‍ය ප්‍රමාණය | වෙනස | වෙනසෙහි වටිනාකම |
|---|---|---|---|---|---|
| | | වර්ග මීටර් / ඝණ මීටර් | වර්ග මීටර් / ඝණ මීටර් | වර්ග මීටර් / ඝණ මීටර් | රු. |
| 04 | ඩවල් ගැසීම | 04 | - | 04 | 5,930 |
| 05 | 1:2:4 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යෙදීම | 1.89 | 2.48 | 0.59 | 16,777 |
| 06 | සැටලින් ගැසීම | 56.70 | 41.12 | 15.58 | 34,432 |
| 07 | 1:3:6 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යෙදීම | 11.34 | 9.26 | 2.08 | 45,040 |
| 08 | Weep hikd (pvc 100m) | 6.30 | 2.70 | 3.6 | 6,342 |
| 09 | පස් පිරවීම | 6.30 | 8.58 | 2.28 | 3,420 |



CamScanner

(ඇ) මෙම පැති බැම්ම මාර්ගයේ ආරක්ෂාවට යොදන බව දක්වා තිබුණද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ මාර්ගයට යාබද ඉඩම් හිමිකරුගේ ඉඩම මායිම්වල ආරක්ෂාව සඳහා වැට සකස් කිරීමට යොදාගත් බැම්මක් බවයි. මෙම වැට නිසා මාර්ගයේ වාහන ගමන් කිරීමටද ඉතා අසීරු බවත් නිරීක්ෂණය විය. විස්තර ඡායාරූප 03 හි දැක්වේ.





3.3 ඇදිගම බහු කාර්ය සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම

-----------------------------------------------------

මෙම ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා වැඩ විෂයන් 13 ක් ඇතුළත් කර රු.1,659,959 ක ඇස්තමේන්තුවක් සකස් කර මිල ගණන් කැඳවීමකින් තොරව (2021.09.29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව) ජයලත්කන්ද ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ මාස 01 සති 02 කින් වැඩ ඉටුකිරීම සඳහා ගිවිසුම් ගතව තිබුණ අතර 2024.08.29 දිනැතිව රු.1,659,959 ක මුදලක් ගෙවීම් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.


(අ) මෙම ව්‍යාපෘතිය යටතේ අත්තිවාරම් මට්ටමට ගොඩනගා ඇති ගොඩනැගිල්ලේ වැඩ විෂයය අංක 06 අනුව දිග මීටර් 09 ක්වූ මි.මි. 225 x 225 ප්‍රමාණයේ තලාද 03 ක් (බීම්) හා දිග මීටර් 6.4 ක්වූ හා 225 x 225 ප්‍රමාණයේ තලාද 04 ක් සඳහා ඝණ මීටර් 2.6 ක් ඇස්තමේන්තු කර තිබුණද, ගෙවීම් වාර්තාව අනුව මීටර් 10.9 ක් දිගැති තලාද 03 ක් සහ මීටර් 8.4 දිගැති තලාද 04 ක් යොදා තිබූ බැවින් ඝණ මීටර්

3.35 ක් සඳහා රු.114,580 ක් ගෙවීම නිසා ඝණ මීටර් 0.69 ක් වෙනුවෙන් රු.23,600 ක් ඇස්තමේන්තුව ඉක්මවා ගෙවා තිබුණි.

(ආ) වැඩ විෂයය අංක 07 අනුව මීටර් 9.6 x 8.6 x 0.120 ප්‍රමාණයට කොන්ක්‍රීට් තට්ටුවක් ඉදිකිරීමට ඇස්තමේන්තු කර තිබුණද ගෙවීම් වාර්තා අනුව 10.9 x 8.4 x 0.12 ප්‍රමාණයට ඝණ මීටර් 10.98 ක් සඳහා ගෙවීම කර තිබූ බැවින් ඇස්තමේන්තු ප්‍රමාණය ඉක්මවා ඝණ මීටර් 1.07 ක් සඳහා රු.36,627 ක් ගෙවා තිබුණි.

(ඇ) මුළු ගොඩනැගිල්ල ඉදිකර අවසන් කිරීමට හැකි පරිදි ප්‍රතිපාදන වෙන් නොකිරීම නිසා ඉතිරි වැඩ කොටස් ඉටු කිරීමකින් තොරව අතර මග නවතා දමා තිබුණු බැවින්, මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණු අතර 2024 වර්ෂයේ දරන ලද රු.1,659,959 ක් 2022 වර්ෂයේදී දරන ලද රු.550,748 ක් වශයෙන් එකතුව රු.2,210,707 ක වියදම නිශ්ක්‍රිය වියදමක් බවට පත්ව තිබුණි.

(ඇ) තවද විගණන දිනය වූ 2025 ජනවාරි 23 වන විට කොන්ක්‍රීට් තට්ටුව වැසි ජලය හා හිරු එළියට නිරාවරණය වීමත් කොන්ක්‍රීට් තට්ටුව හා එයින් ඉහල මහලය ඉදිකිරීම සඳහා මතුකර (පන්නා) ඇති කම්බි දිරාපත් වෙමින් පවතින බවද නිරීක්ෂණය විය. විස්තර ඡායාරූප 04 හි දැක්වේ.




3.4 දැදිගම මලන්දෙනිය අඹලෙන පිවිසුම් මාර්ගය හා පඩිපෙළ සංවර්ධනය කිරීම

---

මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා වැඩ විෂයන් 13 ක් ඇතුළත් කර ඇස්තමේන්තුවක් සකස්කර මිල ගණන් කැඳවීමකින් තොරව (රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021 හා 2021 සැප්තැම්බර් 29 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව) පිටදෙනිය ගොවි සංවිධානය සමඟ දින

15 ක් ඇතුළත කර්මාන්තය නිමකිරීම සඳහා 2024 දෙසැම්බර් 06 දින ගිවිසුම් ගතව තිබුණි. 2024 දෙසැම්බර් 24 දිනැතිව මෙම කර්මාන්තය සඳහා රු.1,710,657 ක මුදලක් ගෙවීම් සඳහා කටයුතු සලසා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මෙම මාර්ගයේ ආරම්භක ස්ථානයත් මෙම ව්‍යාපෘතිය ඉටු කළ ස්ථානයත් අතර වාහන ගමන් කිරීමටද ඉතා අපහසු ස්ථානයන් තිබූ අතර එම කොටස් ඉටු කිරීමකින් තොරව මාර්ගය අවසානයේ වූ කොටස ඉටුකර තිබුණි. විස්තර ඡායාරූප 05 හි දැක්වේ.




(ආ) මෙම අඹලෙන මිනිස් වාසයෙන් තොරව වූ අතර වල් බිහි වී ඇති බැවින් මෙම ස්ථානයට සංචාරකයන් නොපැමිණෙන බවත් නිරීක්ෂණය වූ අතර ඉදිකරන ලද මාර්ගය එම ස්ථානයට මඳක් ඈතින් වූ පෞද්ගලික ඉඩම් හිමියකුට අයත් එලදාව ලබා ගන්නා (රබර්) ඉඩමක් දක්වා සකස්කර එතැනින් පිවිසුම් මාර්ගය නවතා තිබුණි. පඩිපෙළ ඉදිකරන ලද හා කොන්ක්‍රීට් කරන ලද මාර්ගය සහිත ඉඩම වතු හිමියාගේ ඉඩම් වන අතර එම ඉඩම් කොටස් සභාවට පවරා ගැනීම කර නොතිබුණි. විස්තර ඡායාරූප 06 හි දැක්වේ.

(ඇ) නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඇස්තමේන්තු පිළියෙළ කිරීම නිසා ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව හා මිනුම් වාර්තා අතර සැලකිය යුතු වෙනස්කම් තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැඩ විෂයය අංකය | විස්තරය | ඇස්තමේන්තු ප්‍රමාණය | තත්‍ය ප්‍රමාණය | වෙනස | වෙනසෙහි වටිනාකම |
|---|---|---|---|---|---|
| | | වර්ග මීටර් / ඝණ මීටර් | වර්ග මීටර් / ඝණ මීටර් | වර්ග මීටර් / ඝණ මීටර් | රු. |
| 09 | 1:2:4(19) ප්‍රමාණයේ කොන්ක්‍රීට් දැමීම | 16.32 | 8.94 | 7.38 | 216,477 |
| 10 | සැටලින් ගැසීම | 27.20 | 20.84 | 6.36 | 14,061 |
| | | | | | 230,538 |

මේ අනුව වැඩ විෂයයන් 02 ක එකතුව රු.230,538 ක් සඳහා අධි ඇස්තමේන්තු පිළියෙල කර ඇතිබව නිරීක්ෂණය වේ.



CamScanner

3.5 කැටගොඩෙ වත්ත කොම්පෝස්ට් අංගනය ඉතිරි වැඩ සහ ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානයේ දෙවන අදියර ස්ථාපිත කර ගැනීම.

---

මෙම ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා වැඩ විෂයන් 10 ක් ඇතුළත් කර රු.2,600,000 ක ඇස්තමේන්තුවක් සහ වැඩ විෂයන් 16 ක් ඇතුළත් රු.3,091,213 ක ඇස්තමේන්තුවක් වශයෙන් අරමුදල් ප්‍රභවයන් 02 කින් එකතුව රු.5,691,213 ක ප්‍රතිපාදන සලසාගෙන වෙන්කර පිළිවෙලින් අඹේපුස්ස ගොවි සංවිධානය හා අඹේපුස්ස වැඩිහිටි සමිතිය සමඟ සභාව ගිවිසුම් ගතව තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මෙම කර්මාන්ත 02 න් කොන්ක්‍රීට් කුළුණු 06 ක් හා කුළුණු 04 ක් වශයෙන් කුළුණු 10 ක් ඉදිකර ඒ මත යකඩ බාල්ක දමා වහලය සවිකර තිබුණු අතර තවදුරටත් වහලය දික් කිරීමට අවශ්‍ය පරිදි යකඩ බාර් පන්නා තිබුණි. මෙම යකඩ කොටස් වැස්සට හා හිරු එළියට නිරාවරණය වෙමින් පවතින නිසා දිරායාමට හැකියාව පවතින බවද නිරීක්ෂණය විය. විස්තර ඡායාරූප 07 හි දැක්වේ.





(ආ) නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඇස්තමේන්තු සැකසීම නිසා ඇස්තමේන්තු ප්‍රමාණය හා තත්‍ය ප්‍රමාණය අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. මේ අනුව ඇස්තමේන්තු කරන ලද ඇතැම් වැඩ කොටස් ඉටුකර නොතිබුණු අතර ඇතැම් වැඩ කොටස් ඇස්තමේන්තු ප්‍රමාණය ඉක්මවා ඉටුකර ගෙවීම් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

i. කැටගොඩේ වත්ත කොම්පොස්ට් අංගනය ඉතිරි වැඩ

| වැඩ විෂයය අංකය | වැඩ විෂයය විස්තරය | මිනුම් ඒකකය | ඇස්තමේන්තු ප්‍රමාණය | තත්ව ප්‍රමාණය | වෙනස | වෙනසේ වටිනාකම |
|---|---|---|---|---|---|---|
| | | | | | | රු. |
| 01 | 1:2:4(3/4) කොන්ක්‍රීට් කුළුණු (COLOUMS) ඉදිකිරීම | Cube | 0.78 | 0.72 | 0.06 | 5,532 |
| 02 | 1:2:4(3/4) කොන්ක්‍රීට් තලාද (BEAMS) ඉදිකිරීම | Cube | 0.66 | - | 0.66 | 67,282 |
| 03 | එම තලාද සඳහා සැටලින් ගැසීම | Sqft | 100 | - | 100 | 20,868 |
| 04 | කුළුණු සඳහා සැටලින් ගැසීම | Sqft | 156 | 288 | 132 | 46,464 |
| 05 | යකඩ කම්බි | Kg | 221 | 107 | 114 | 63,675 |
| 10 | STIFFINER සපයා සවි කිරීම | Nos | 03 | - | 03 | 8,550 |

මේ අනුව වැඩ විෂයයන් 03 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණි.

i. ඝණ අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානයේ දෙවන අදියර ස්ථාපිත කර ගැනීම

| වැඩ විෂයය අංකය | වැඩ විෂයය විස්තරය | මිනුම් ඒකකය | ඇස්තමේන්තු ප්‍රමාණය | තත්ව ප්‍රමාණය | වෙනස | වෙනසේ වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|
| a-2 | ABC සපයා තැලීම | Cube | 5.44 | 11.20 | 5.76 | 119,232 |
| b-1 | 1:3:6 (3/4) මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් දැමීම | Cube | 0.34 | 0.23 | 0.11 | 9,552 |
| b-2 | 1:2:4 (3/4) මිශ්‍රණයෙන් බිම් මහලේ තලාද කොන්ක්‍රීට් දැමීම | Cube | 0.68 | 1.88 | 1.20 | 116,153 |
| b-3 | 1:2:4 (3/4) මිශ්‍රණයෙන් බිම් මහල කුළුණු කොන්ක්‍රීට් කිරීම | Cube | 0.36 | 0.24 | 0.12 | 11,065 |
| b-4 | 1:2:4 (3/4) මිශ්‍රණයෙන් පළමු මහල තලාද කොන්ක්‍රීට් කිරීම | Cube | 0.52 | 0.74 | 0.22 | 22,437 |
| b-5 | 1:2:4 (3/4) මිශ්‍රණයෙන් පළමු මහල කුළුණු කොන්ක්‍රීට් කිරීම | Cube | 1.66 | 0.49 | 1.17 | 107,883 |
| b-7 | කුළුණු සඳහා සැටලින් ගැසීම | Sqft | 352 | 222 | 130 | 45,760 |
| c-1 | සවි ගැන්වීම (කම්බි බැදීම) | Kg | 403 | 506 | 103 | 57,532 |



CamScanner

(13)

(ඇ) මෙම කර්මාන්තය නිම කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගෙන කර්මාන්තය නිම කිරීම වෙනුවට ප්‍රතිපාදන කොටස් වශයෙන් සලසාගෙන ගොඩනැගිල්ලේ කොටසක් පමණක් ඉදිකර තිබීම නිසා 2024 වර්ෂයේදී දරන ලද එකතුව රු.5,691,213 ක වියදම නිශ්ක්‍රීය වියදමක් බවට පත්ව තිබුණි.

ඉහත සඳහන් කරුණු පිළිබඳව ඔබගේ අදහස් විමසුමේ දින සිට සති 02 ක කාලයක් තුළ ලබාදීමට කටයුතු කරන්නේ නම් කෘතඥ වෙමි.

<u>පිළිතුරු එවිය යුතු ලිපිනය</u>

විගණන අධිකාරී,

විගණන උප කාර්යාලය,

කලාප අධ්‍යාපන කාර්යාලය,කෑගල්ල.

Samarakoon.

එස්.එම්.එස්.කේ. සමරකෝන්,

එස්. එම්. එස්. කේ. සමරකෝන්
විගණන අධිකාරී
ජාතික විගණන කාර්යාලය
සබරගමුව

විගණන අධිකාරී,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති වෙනුවට

පිටපත :- 1.පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව, රත්නපුර.

2. පළාත් පාලන සහකාර කොමසාරිස්, කෑගල්ල.

උපලේඛන 01

| වැඩසටහන | | ව්‍යාපෘතිය | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| විශේෂ සංවර්ධන ව්‍යාපෘති | i. | පැරණි කාර්යාල භූමියේ සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම | 50,000,000 |
| | ii. | කැටගොඩ වත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ නව කසළ අංගනය ඉදිකිරීම | 620,000 |
| පොදු පරිපාලනය | i. | කාර්යාලය ඉදිරිපිට වැට සකස් කිරීම හා ගේට්ටුවක් සකස් කිරීම | 2,500,000 |
| | ii. | වාහන නඩත්තු ඒකකයක් සැකසීම | 200,000 |
| | iii. | සභාගර්භයේ ශබ්ද විකාශන පද්ධතිය නවීකරණය කිරීම | 50,000 |
| | iv. | සභාගර්භය නවීකරණය කිරීම | 400,000 |
| සෞඛ්‍ය සේවා | i. | කසළ ප්‍රතිචක්‍රීකරණ කොම්පෝස්ට් ව්‍යාපෘතිය | 950,000 |
| | ii. | තෙලි ඇල්ල කසළ වැඩබිම නඩත්තුව හා ඒ ආශ්‍රිත වන වගාව | 50,000 |
| | iii. | අල්ගම නගරයට පොදු වැසිකිලියක් ඉදි කිරීම | 1,200,000 |
| භෞතික සැලසුම් | i. | මංමාවත් ගොඩනැගිලි හා කානු පද්ධති සංවර්ධනය | 20,000,000 |
| | ii. | රථ වාහන නැවතුම් පලක් සකස් කිරීම | 800,000 |
| | iii. | ක්‍රීඩා පිටි සැකසීම | 400,000 |
| | iv. | මාර්ග හා ගොඩනැගිලි නඩත්තු ඒකකයන් සකස් කිරීම | 100,000 |
| | v. | මාහේන ජල යෝජනා ක්‍රමයට මුරකුටියක් සැකසීම | 800,000 |
| වෙනත් උපයෝගී සේවා | i. | පොදු ළිං ඉදි කිරීම | 500,000 |
| | ii. | සතිපොල සංවර්ධනය | 1,000,000 |
| | iii. | පැරණි කාර්යාල භූමියේ සාප්පු සංකීර්ණයක් ඉදි කිරීම | 8,000,000 |
| | iv. | වරකාපොල හෙළ බොජුන්හල සඳහා ළිඳක් සකස් කිරීම | 800,000 |
| සුභ සාධන සේවා | i. | පුස්තකාල ජාල ගත කිරීම | 600,000 |
| | ii. | සතිපොල භූමිය අසල ළමා උද්‍යානය හා ඇවිදින මංතීරුව නඩත්තුව | 500,000 |
| | iii. | සභාව සතු ප්‍රජාශාලාව නවීකරණය | 200,000 |
| | iv. | වාරියගොඩ පුස්තකාලය ඉදිකිරීමේ මූල්‍ය කටයුතු | 100,000 |
| | v. | නගරශාලාවේ ඉතිරි වැඩ | 58,000,000 |
| | | | 147,770,000 |